# විශේෂිත නිපුණතා සහිත ජපන් රැකියා වැඩසටහන (SSW)

ශ්‍රී ලංකා රජය සහ ජපන් රජය අතර අත්සන් කරන ලද සහයෝගිතා ගිවිසුමට අනුව, ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට ජපානයේ රැකියා අවස්ථා උදාකර ගැනිමට අවශ්‍ය කුසලතා පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. එහිදී හෙද සාත්තු සේවා (Nursing Care Workers) සහ ආහාර සේවා කර්මාන්තය (Food Service Industry) යන අංශ සඳහා කුසලතා පරීක්ෂණය 2022 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවලදී පවත්වනු ලබන බව ජපානය විසින් නිවේදනයකර ඇත. වසරකට විභාග වාර 06 ක් පැවැත්වීමට යෝජිතය.

මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය (Zoom තාක්ෂණය) ඔස්සේ පැවැත්වීම මේ වන විට ආරම්භ කර ඇත. මේ සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.lk යන වෙබ් අඩවියට පිවිස විශේෂිත නිපුණතා සහිත ජපන් රැකියා වැඩසටහන (SSW) මගින් ඔබට ලබාගත හැකි අතර, වෙබ් අඩවියෙහි සඳහන් අයදුම්පත සම්පූර්ණ කර දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ලියාපදිංචි වන්න. (Online Submit)

මෙම කුසලතා පරීක්ෂණයට පෙනී සිට විභාගය සමත්වීම සඳහා ඔබගේ වෘත්තීය කුසලතාවය හා ජපන් භාෂා ප්‍රවීණතාවය යාවත්කාලීන කරගන්නා ලෙස දන්වා සිටියි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය